# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1895/42 - 2015 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2015.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ 255 වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැළසුම්, නීතිය හා විනය, ඉඩම්, විදුලිය, නිවාස ඉදිකිරීම් හා සැලසුම්, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 වන වගන්තියේ (1ආ)(අ) යන උපවගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව වල්වෙට්ටිතුරෙයි නගර සභාවේ කාර්යයන් පරීක්ෂා කොට වාර්තා ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද විශ්‍රාමලත් දිස්ත්‍රික් අධිකරණ නීතිපති කන්දයියා අරියනායගම් මහතා යටතේ සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කමිටුවෙන් ඉදිරිපත් කර ඇති නිගමන පිළිබඳ මනා ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු මම ඒ සම්බන්ධයෙන් ස්වාධීන නිගමනයන් වලට එළඹෙමි.

ඒ අනුව වල්වෙට්ටිතුරෙයි නගර සභාව විසින් කටයුතු කිරීමේදී, පරීක්ෂණ වාර්තාවේ සඳහන් පරිදි ඔවුන් විසින් සභාව කටයුතු නොකිරීමට ඕනෑකමින්ම අක්‍රීය ක්‍රියාවන් සිදුකර ඇති බවට මා සෑහීමට පත්වෙමි.

එසේ සෑහීමකට පත්වීමෙන් පසු 1989 වන වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1939 වන වසරේ අංක 67 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 4(ආ)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 වන වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වල්වෙට්ටිතුරෙයි නගර සභාව විසුරුවා හරින බවට මෙයින් දන්වමි.

ක. වී. විග්නේශ්වරන්,<br>
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් සහ සැළසුම්,<br>
නීතිය හා විනය, ඉඩම්, විදුලිය, නිවාස ඉදිකිරීම් හා<br>
සැලසුම්, කර්මාන්ත, රැකියා නියැලීම් සංවර්ධන<br>
කටයුතු, සංචාර, පළාත් පාලන හා පළාත් පරිපාලන<br>
විෂයයන් භාර අමාත්‍යවරයා,<br>
උතුරු පළාත.

2014 දෙසැම්බර් මස 31 වැනි දින,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,<br>
අංක 26, සෝමසුන්දරම් ඇවිනිව්,<br>
චන්ඩුක්කුලී,<br>
යාපනය.

01-514

1A - PG 2314— 15 (2015/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*